"කොවිඩ්-19 ආසාදිත රෝගියෙකු මියගිය අවස්ථාවේදී විශේෂයෙන්ම ආදාහනය සිදු කරන දර්ශන පෙන්වීමේදී අදාළ දේහය ආදාහනාගාරයට රැගෙන යන අයුරු පෙන්වීම මගින් සහ ආදාහනය කිරීමට සූදානම් වන අවස්ථාවේදී එම මෘත ශරීරය බහාලූ පෙට්ටිය ආදාහනාගාරයට ඇතුලත් කර යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට පෙර අදාළ පිරිස් ඇඳ සිටි ආරක්ෂිත කබා සහ අත්වැසුම් ආදිය ඉවත්කර ඒ තුලට දමන දර්ශන මගින් මියගිය පුද්ගලයාට යම් අගෞරවයක් සිදුවන බැවින්, එම තත්වය මග හරවා ගැනීම සඳහා අත්‍යාවශ්‍ය නම් දේහය සුසාන භූමිය වෙත රැගෙන එන දර්ශන පමණක් විකාශය කරන ලෙස කරනු ලබන ඉල්ලීම", රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් මාධ්‍ය සඳහා කොවිඩ්-19 වාර්තාකරණයේදී පිළිපදින ලෙසින් ඉල්ලා සිටිමින් නිකුත් කරනු ලැබූ නිර්දේශ මාලාවට ඇතුළත් වේ.

කොවිඩ්-19 මගින් මිය ගිය අයගේ දේහය පිළිබඳ අවසන් කටයුතු සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී උක්ත නිර්දේශයන් පැනවී ඇත්තේ මියගිය අයට සිදුවන යම් අගෞරවයක් වැළැක්වීමට සහ ඒ ඔස්සේ මියගිය අයගේ සමීපතමයන්ට ඇති විය හැකි සිත් වේදනාවක් වැළැක්වීම සඳහායි. එම නිර්දේශයන් පිළිපදිමින් වාර්තාකරණය සිදු කිරීම සියලුම මාධ්‍ය අත රැඳි වගකීමයි.

මූලාශ්‍ර:[https://mcusercontent.com/.../76820bda-4513-4f3d-9d49...](https://mcusercontent.com/.../76820bda-4513-4f3d-9d49...)

**#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #SinhalaNews #SirasaTV #HiruTV #Swarnavahini #ITN #Rupavahini**